# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
## காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
## LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

ඉඩම් මහලේකම් කාර්යාලය,
නො: 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல: 1200/6, ராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
No: 1200/6, Rajamalwatta Road, Battaramulla.

ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2864051
ඊමේල් / மின்னஞ்சல் / E-mail: info@landcommdept.gov.lk


මගේ අංකය / எனது இல / MY NO: 5/2/6/රන්බිම චක්‍ර ලේඛ
ඔබේ අංකය / உமது இல / YOUR NO:
දිනය / திகதி / DATE: 2014.12.02

චක්‍ර ලේඛ අංක - 2014/09

සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරු
ප්‍රාදේශීය ලේකම්වරු
නියෝජ්‍ය / සහකාර ඉඩම් කොමසාරිස්වරු (අන්තර් පළාත්),

<u>ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත්කර ඇති අවසරපත්‍ර සඳහා දීමනාපත්‍ර සකස් කිරීම</u>

ඉහත ශීර්ෂය යටතේ 2013.10.31 දින මාවිසින් නිකුත් කර ඇති අංක 2013/02 දරණ චක්‍රලේඛය කෙරෙහි කාරුණික අවධානය යොමු කරවමි.

ඉහත චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව බලපත්‍රයේ සඳහන් ඉඩම් ප්‍රමාණයට වඩා වැඩියෙන් බලපත්‍රලාභියා ඉඩම් භුක්ති විඳින එමෙන්ම අතිරේක ප්‍රමාණය වෙනම ඉඩම් කැබැල්ලක් ලෙස මැන වෙන්කළ යුතු අවස්ථාවලදී දීමනාපත්‍රය සකස්කළ යුතු ප්‍රමාණයට රේඛාචිත්‍ර ලබාගත යුතුවේ.

එහෙත් මෙම චක්‍රලේඛයේ උපදෙස් පිළිබඳව නිසි අවධානය යොමුවීමට එම මිනින්දෝරුවරුන් අනුගමනය කරනු ලබන සාමාන්‍ය ප්‍රතිපත්තිය අනුව මෙම ප්‍රමාණයේ වෙනස 10% නොඉක්මවන අවස්ථාවලදී භුක්තිවිඳින ප්‍රමාණයටම මැනීම් කර තිබෙන අවස්ථාවන් අනාවරණය වී ඇත. එවැනි අවස්ථාවලදී වෙනස 10% තුළ පැවතියද ප්‍රමාණය පර්චස් 10 ට වඩා වැඩිවීම වැනි හේතු නිසා අතිරේක කොටස වෙන්කර නියමිත කොටසට රේඛා චිත්‍ර ලබාදීමට සිදුවන අවස්ථාවලදී එම ඉඩම නැවත මැනීමට සිදුවේ. මෙසේ දෙවරක් මැනීමේ අපහසුතාවය මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් පෙන්වා දී ඇත.

එම නිසා 2014.01.01 දිනට පෙර එසේ මැන ඇති ඉඩම් සම්බන්ධයෙන් නැවත මැන රේඛාචිත්‍ර ලබා ගැනීමට අවශ්‍ය නොවන බවත් මැන ඇති එනම් භුක්තිවිඳින ප්‍රමාණයට රේඛාචිත්‍ර ලබා ගෙන දීමනාපත්‍ර සකස්කළ හැකි බවත් මෙයින් දන්වමි.

එහෙත් මිනින්දෝරුවරුන් විසින් ප්‍රමාණයේ වෙනස 10% ඉක්මවන සේ මැන ඇත්නම් එවැනි දෝෂ නිවැරදි කළ යුතු හෙයින් 2013/02 චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව නැවත මැනීම සඳහා පියවර ගත යුතුවේ. 2014.01.01 දිනෙන් පසුව මැනීම් සම්බන්ධයෙන් 2013/02 දරණ චක්‍රලේඛයේ උපදෙස් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කළ යුතුවේ.

2013/02 දරණ චක්‍රලේඛයේ 02 ඡේදයේ අංක 11 යටතේ සඳහන් බලපත්‍රකරු භුක්තිවිඳින ඉඩම් ප්‍රමාණය බලපත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා අඩුවන එමෙන්ම එම වෙනස 10% ඉක්මවන අවස්ථාවලදී බලපත්‍රයේ සඳහන් ප්‍රමාණය සංශෝධනය කළ යුතුවේ. ඒ සඳහා අදාළ පරිදි පළාත් ඉඩම් කොමසාරිස් හෝ ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු බව ද සඳහන්වේ. ඒ සඳහා කල්ගතවීම හේතුවෙන් දීමනාපත්‍ර සකස් කිරීමේ කටයුතු ප්‍රමාදවන බවට ප්‍රදේශීය ලේකම්වරු අදහස් ඉදිරිපත්කර ඇත. ඊට පිළියමක් වශයෙන් බලපත්‍රයේ සඳහන් ප්‍රමාණයන් සංශෝධනය කිරීම සඳහා අදාළ ඉඩම පිහිටි බලප්‍රදේශයේ ඉඩම් රාජකාරි ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කරයි නම් ප්‍රාදේශීය ලේකම් වෙත ද, අන්තර් පළාත් නියෝජ්‍ය / සහකාර කොමසාරිස් විසින් සිදු කරයි නම් නියෝජ්‍ය / සහකාර කොමසාරිස් වෙත ද බලය පවරමි.

කරුණාකර මෙම චක්‍රලේඛයේ උපදෙස් මගින් 2013/02 චක්‍රලේඛයේ අදාළ කරුණු සංශෝධනය වූ සේ සලකන්න.

ආර්. පී. ආර්. රාජපක්ෂ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් -

1. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය.
2. මිනුම්පති - අදාළ සියළුදෙනා ඉක්මනින් දැනුවත් කිරීමට.
3. සහකාර ඉඩම් කොමසාරිස් (ඉඩම්) - ප්‍රධාන කාර්යාලයේ අදාළ සියළුදෙනා දැනුවත් කිරීමට.